**එ.ජ. තානාපති ජුලී චංග් මහත්මිය විසින්**
**සංස්කෘතික සංරක්ෂණය සඳහා වන තානාපති අරමුදලේ**
**සංරක්ෂණ ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ දී පල කරන ලද අදහස්**
**මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමුද්‍රීය පුරාවිද්‍යා කෞතුකාගාරය, ගාල්ල**
**2022 දෙසැම්බර් 13**

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමන්,

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන්,

සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ සහ සංරක්ෂණ රසායනාගාරයේ සාමාජිකයින්,

සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ නිලධාරීන්, අනෙකුත් ගෞරවනීය අමුත්තන්, මිතුරන්, හවුල්කරුවන් සහ මාධ්‍ය සාමාජිකයිනි,

සුභ උදෑසනක් වේවා. සුන්දර ගාලු කොටුව නැරඹීම සඳහා නැවත වරක් ගාල්ලට පැමිණෙන්නට හැකිවීම අපූරු අවස්ථාවක් වනවා. අද උදෑසන මෙතැනට එන අතරමගදී, මම වෙරළ තීරයේ සහ දිදුලන සාගරයේ දර්ශනයක් දුටුවා, එනිසා, සංස්කෘතික සංරක්ෂණය සඳහා වූ එක්සත් ජනපද තානාපති අරමුදලේ අපගේ නවතම ව්‍යාපෘතියේ ආරම්භය නිවේදනය කිරීමට අද ඔබ සමඟ එක්වීමට සුදුසුම ස්ථානය මෙය වන බවක් පෙනෙනවා. අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සිට ගොඩවාය නැව දියබත් ස්ථානයේ නිරාවරිත පුරාවස්තු විද්‍යාත්මකව ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සමාරම්භ කිරීම සඳහා සහභාගිවන්නට ලැබීම මා ලැබූ ගෞරවයක්.

ඉදිරි වසර දෙක තුළ, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමුද්‍ර පුරාවිද්‍යා ඒකකය, දකුණු පළාතේ හම්බන්තොට ජාත්‍යන්තර වරාය ආසන්නයේ පිහිටි ගොඩවාය නැව දියබත් ස්ථානය ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා කටයුතු කරනු ඇති. ශ්‍රී ලංකාවේ පැරණිතම නැව් දියබත් ස්ථානවලින් එකක් වන මෙහි මුලින්ම කෞතුක වස්තු සොයා ගනු ලැබුවේ 2008 දී ශ්‍රී ලාංකික ධීවරයින් දෙදෙනෙකු සහ කිමිදුම්කරුවන් විසිනුයි. ඉන්පසුව, ඒ ඔස්සේ යමින් සමුද්‍ර පුරාවිද්‍යා ඒකකය දියබත් වූ නැව සොයා ගැනීමටත්, එම ස්ථානය තේරුම් ගැනීමට සහ එය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ උත්සාහය ආරම්භ කළා. මුහුදු පත්ලේ මීටර් 32ක් පහළට ජලයේ ගිලුණු නැවක් ගැන සිතන්න. සමුද්‍ර පුරාවිද්‍යාඥයින් කිමිදීමෙන්, කෞතුක වස්තු ලේඛනගත කිරීම, සංරක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ළඟා විය යුතු ස්ථානය පිහිටා ඇත්තේ එතැනයි. මේ නෞකාවේ සම්භවය, එහි අන්තර්ගතය සහ ජල සොහොනක එය අවසන් ගමන් ගිය ආකාරය පිළිබඳ වැදගත් අභිරහස් කිහිපයකට කවදා හෝ පිළිතුරු සපයා ගැනීමට මේ පර්යේෂණ හරහා බලාපොරොත්තු වනවා. මෙය පහසු කාර්යයක්- හෝ පහසු කිමිදීමක් නොවේ. නමුත් එය

ඉතා අර්ථාන්විත සහ සැබවින්ම වැදගත් කාර්යයන් වනවා. කවදා හෝ එය පෞද්ගලිකව මටත් දැකීමට හැකි වනු ඇතැයි මම බලාපොරොත්තු වනවා.

මෙම වැදගත් දියබත් වූ නැව ලේඛනගත කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලාංකික සමුද්‍ර පුරාවිද්‍යාඥයින්ට සහාය දැක්වීමට හැකිවීම ගැන එක්සත් ජනපදය ආඩම්බර වනවා. මෙම ව්‍යාපෘතිය පරිකල්පනය වහාම ග්‍රහණය කර ගන්නා එකක් වන අතර පුරාවිද්‍යාඥයින්ට පිලිතුරු අනාවරණය කර ගැනීමට ඒ සම්බන්ධයෙන් බොහෝ ප්‍රශ්න තිබෙනවා. මෙම ස්ථානය අධ්‍යයනය කරන විද්‍යාඥයන් සහ පුරාවිද්‍යාඥයින් කුමක් නිගමනය කළත්, එක් දෙයක් නම් ස්ථිර යි: ඉන්දු පැසිෆික් සාගරය මුළුල්ලේ ගවේෂකයන්, වෙළඳුන් සහ ජාතීන් සඳහා වෙළඳ හවුල්කරුවෙකු, මිතුරෙකු සහ ආරක්ෂිත සහ විවෘත වරායන් සහිත ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ දිගුකාලීන සහ ඉතා වැදගත් භූමිකාව ගොඩවාය නැව් දියබත් ස්ථානය මගින් යලි තහවුරු කරනවා. එය ඉතා වැදගත් කීර්තියක් වන අතර, අද දක්වාම ශ්‍රී ලංකාවට ඉන් යහපත සැලසෙනවා.

ගොඩවාය ඉතිහාසය ක්‍රිස්තු පූර්ව පළමු හා දෙවන සියවස් අතර අතීතය දක්වා දිව යන අතර, ගාල්ලේ සිටින මේ අවස්ථාවේ දී මට වඩාත් මෑත කාලීන ඉතිහාසය ගැන සිහි වනවා. දිවයිනේ ප්‍රථම විධිමත් එක්සත් ජනපද පැමිණීම වූයේ ඇමරිකානු වාණිජ ඒජන්සියේ පැමිණීම වන අතර, 1870 වන තෙක් එහි පළමු කාර්යාලය ගාල්ලේ පැවතී තිබෙනවා. එතැන් සිට අපි බොහෝ දුර පැමිණ තිබෙනවා. මීට මාස කිහිපයකට පෙර, මම අපගේ තානාපති කාර්යාලය කොළඹ නව පරිසර සංවේදී ගොඩනැගිල්ලකට ගෙන ගියා, එය සැබවින්ම ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා අපගේ කැපවීම පිළිබඳ සාක්ෂියක්. තවත් මාස කිහිපයකින්, අපි අපේ රටවල් අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 75 වැනි සංවත්සරය සැමරීමට පටන් ගන්නවා.

ඒ සම්බන්ධයේ දීර්ඝායුෂ සහ ගැඹුර මට වැදගත්. ගොඩවාය ව්‍යාපෘතිය යනු එක් වරක් පමණක් ලැබුණු යම් ව්‍යාපෘතියක් නොවේ. මෙය පසුගිය වසර 17 තුළ එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සමඟ හවුල් වී ක්‍රියාත්මක කළ සංස්කෘතික සංරක්ෂණ ව්‍යාපෘති දුසිමකට අධික සංඛ්‍යාවක නවතම ව්‍යාපෘතියයි. එසේ පෙර සිදුකළ ව්‍යාපෘති අතරට අනුරාධපුරයේ යුනෙස්කෝ ලෝක උරුම අඩවියේ විහාර ලේඛනගත කිරීම සහ ආදිවාසි, දෙමළ හින්දු සහ බෞද්ධ ප්‍රජාවන්ගෙන් වියැකී යමින් පවතින වඳවී යන සම්ප්‍රදායික හා දේශීය සංගීත සහ නැටුම් චාරිත්‍ර සහ ඊට අදාළ ශිල්පීය ක්‍රම හතරක් සංරක්ෂණය කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ සිදුකළ ව්‍යාපෘතියක් ඇතුළත් වනවා. ලොව නන් දෙසින් පැමිණෙන සංචාරකයින්ට ශ්‍රී ලංකාවේ වෛවර්ණ සංස්කෘතික උරුමය පිළිබඳ දැනුම සහ අවබෝධය වැඩි කරගන්නට මග පාදමින්, මහනුවර පැරණි රජ වාසල සංරක්ෂණය කිරීමේ සහ එහි පුරාවිද්‍යා කෞතුකාගාරය වැඩිදියුණු කිරීමේ බහු අවුරුදු ව්‍යාපෘතියක් විවෘත කිරීමේ උත්සවයට මේ වසර මුලදී සහභාගීවීමට ලැබීම ගැන මම සතුටට පත් වනවා. සමස්තයක් වශයෙන්, මෙම ව්‍යාපෘති එක්සත් ජනපදයෙන් ලබාදෙන ඩොලර් මිලියන 1 කට වඩා අරමුදල් නියෝජනය කරනවා.

ශ්‍රී ලංකාවේ විස්මිත සහ වටිනා සංස්කෘතික උරුමයන් හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ අධ්‍යයනය කිරීම සඳහා ගෞරව කරන, සහ අරමුදල් සැපයීමට උපකාර වන ධූතමණ්ඩලයක් මෙහෙයවීමට ලැබීම ගැන මම ආඩම්බර වනවා. සංස්කෘතික සංරක්ෂණය සඳහා වූ තානාපති අරමුදලේ ප්‍රධාන අරමුණ මෙයයි. දේශීය විශේෂඥයින් විසින් හඳුනාගෙන ශ්‍රී ලාංකිකයන් විසින් සිදු කරන මෙවැනි ව්‍යාපෘති සඳහා අනුග්‍රහය දැක්වීම ගැන අපි ආඩම්බර වනවා. ඔබගේ ප්‍රයත්නයන් සංරක්ෂණය වැඩි දියුණු කරන අතර ඉතිහාසය පිළිබඳ අපගේ අවබෝධය පුළුල් කරන අතරම සංචාරක ව්‍යාපාරයේ අනාගතය සඳහා මග සලසමින් ඊළඟ පුරාවිද්‍යාඥ පරම්පරාවේ ධාරිතාව වැඩි කරනවා. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔබගේ වගකීම්සහගත සහ ප්‍රවීණ භාරකාරත්වයට ස්තූතිවන්ත වන අතර ඔබගේ කණ්ඩායම ලබන වසරේ වැඩි ප්‍රගතියක් ලබා ගැනීමෙන් පසු ඔබ හමුවීමට හම්බන්තොටට පැමිණීමට මම බලාපොරොත්තු වනවා.